ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2463/50 - 2025 නොවැම්බර් මස 22 වැනි සෙනසුරාදා - 2025.11.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

ගොනු අංකය: KDS/PDB/4/3/20/3.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/5/2020/HA/23.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩගම්පහ කෝරලේ සුළු කොට්ඨාසයේ, අංක 633 නාපාන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මැදගෙදර ගම්මැද්ද ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 321099හි කලාප අංක 01, පත්‍ර අංක 01 හා 2025.11.04 දිනැති පිඹුරේ සවිස්තරව සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0253 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ජම්බුගහමඩිත්ත නම් වූ ඉඩම් කොටස.

**කැබලි අංක 01 - ඉඩමේ නම: ජම්බුගහමඩිත්ත; හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය: පූජ්‍ය මුතුගල ධම්මක්කන්ද හිමි, විහාරාධිපති, නාපාන පුරාණ විහාරය, මඩවල-කඩවීදිය; ප්‍රමාණය: හෙක්. 0.0253.**

මායිම්:-

*උතුරට*: නාපාන පුරාණ විහාරය හිමිකම් කියන ජම්බුගහමඩිත්ත; නැගෙනහිරට: නාපාන පුරාණ විහාරය හිමිකම් කියන ජම්බුගහමඩිත්ත; දකුණට: මාර්ගය (ප්‍රාදේශීය සභාව); බටහිරට: නාපාන පුරාණ විහාරය හිමිකම් කියන ජම්බුගහමඩිත්ත.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 දෙසැම්බර් මස 18 වැනි දින පෙ. ව. 10.00 ට පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2025 දෙසැම්බර් මස 11 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

**එස්. එන්. කේ. සේරසිංහ,**
ප්‍රාදේශීය ලේකම්,
පාතදුම්බර.

2025 නොවැම්බර් මස 19 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 11 - 0178

1A - G 45804 - 13 (2025/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*